# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

## ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION

ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය
2021.05.20

අධ්‍යක්ෂ ජනරාල්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

04 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල

**<u>රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින දෙකක් ප්‍රකාශයට පත් කිරීම.</u>**

උක්ත කරුනට අදාලව ඔබේ අංක DSD/HO/05/MF/01/පොදු හා 2021.05.19 දිනැති ලිපිය හා සම්බන්ධවයි.

මේවන විට රටේ ඉතා සීඝ්‍රයෙන් පැතිරයමින් පවතින COVID – 19 වෛරසයෙන් ජනතාව මුදා ගැනීම සඳහා රජය විසින් මේ 2021.05.22 සිට 2021.05.25 දින දක්වා දැඩි සංචරණ සීමා පනවා ඇති කාලවකවානුවකි.ඒසේම සමස්ත රාජ්‍ය සේවයටම 2021.05.24 හා 25 යන දෙදින රජයේ විශේෂ නිවාඩු දින දෙකක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත.එසේ තිබියදී සමෘද්ධි ප්‍රජාමූල බැංකු විවෘත්තව තබන ලෙසට ඔබතුමන් විසින් උපදෙස් ලබාදී ඇත.නමුත් මෙම දින දෙක තුල අප සේවාලාභීන් බැංකුවෙත පැමිණීමක් සිදුනොවන බැවින් මෙම ක්‍රියාව අර්ථ විරහිත ක්‍රියාවක් බැවින් හා අප නිළධාරීන්ගේද ඔවුන්ගේ පවුල් ඒකකයේද ආරක්ෂාව හා අපවෙත පැවරී ඇති සමාජ වගකීම ආරක්ෂා කිරීම සඳහාද එම දින දෙක තුල අප සංගමයේ සාමාජිකයන් සේවයට වාර්තා නොකරවීමට අප සංගමය තීරණය කර ඇත.

එසේ වුවද අපගේ සේවා ස්ථානය වන සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය මේවනවිට පරිඝණක ගතකිරීම් කටයුතු සිදුකරණ බැවින් එම කාලසීමාව නිදහසේ එම කටයුත්ත වෙනුවෙන් යෙදවිය හැකි බව අපගේ මතයයි.එම නිසා කිසිඳු බලකිරීමකින් තොරව ස්ව කැමැත්තෙන් ඒ සඳහා යොමුවිය හැකි නිළධාරීන් එම දින දෙක තුල සේවය සැලසීමට අපගේ කිසිඳු විරෝධතාවයක් නොමැති බවද මෙයින් දන්වා සිටිමි.එසේ කටයුතු කරණු ලබන නිළධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසාදෙන ලෙසට ද කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි.

ඉහත සඳහන් කරුණු කෙරෙහි ඔබතුමන්ගේ අවධානය යොමු කරණ ලෙසත් මෙම ක්‍රියා මාර්ගය සඳහා කිසිඳු බලපෑමක් නොකරණ ලෙසත් කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි.

මෙයට

ප්‍රධාන ලේකම්

බී.එම්.ඒ.වී.බස්නායක

ප්‍රධාන ලේකම්
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

පිටපත් :- 01 . ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මැතිතුම. (කා:දැ:ගැ: හා අ:ක:ස:)

02 . ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශ ලේකම් තුමා. (කා:දැ:ගැ: හා අ:ක:ස:)

03 . සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් (කා:දැ:ගැ:පි:)

04 . සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන් (කා:දැ:ගැ:පි:)

05 . සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් (කා:දැ:ගැ:පි:)


| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
|---|---|---|
| එන්.ජී.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ඒ.වී.බස්නායක |
| දු:අං: 017-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |
| උප සභාපති | උප ලේකම් | ජාතික සංවිධායක |
| ටී.ජී.දයාවංශ | බී.ඩී.ජී.වික්‍රමසිංහ | එච්.ජී.සරත් |
| දු:අං: 071-2585394 | දු:අං:076-5566136 | දු:අං:071-8105051 |